වාහල්කඩ



ධනුද්ධර

ශ්‍රී ලංකාවේ දී පැවති ශ්‍රී ලංකාවට ආධාර දෙන රටවල් කණ්ඩායමේ රැස්වීමට පෙර අත්සන් තබන්නේ යැයි කියූ ඒකාබද්ධ යාන්ත්‍රණයට මෙතෙක් අත්සන් තබා නැත. මේ වන විට ජනාධිපතිනිය එහි නම ද වෙනස් කොට තිබේ. පසුගිය මාසයේ ජාතික රූපවාහිනියේ සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වූ ඇය කියා සිටියේ එහි නම 'සුනාමි සහන මණ්ඩලය' බව ය. දන් අලුගෙන් ම පැතිර යන ආරංචිය වන්නේ ජූනි මස 15 දා ඊට අත්සන් තබන බව ය. එහෙත් දේශපාලන පොර පිටියේ අතීත අත්දැකීම්, වර්තමාන ප්‍රවණතා මත සලකා බැලූ විට පෙනී යන්නේ එය විය නොහැක්කක් බව ය.

ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශ්වකරුවා වන ජනතා විමුක්ති පෙරමුණ මේ යාන්ත්‍රණයට හෝ මණ්ඩලයට විරුද්ධ බව ප්‍රකාශ කර තිබේ. එවැන්නක් ක්‍රියාත්මක කළ හොත් සන්ධාන ආණ්ඩුවක් නොමැති වනු ඇති බව ජනතා විමුක්ති පෙරමුණ ස්ථිරව ම ප්‍රකාශ කර ඇත. පසුගිය දිනෙක ජපානයේ සංවාදයක නිරත වූ ජවිපෙ නායකයන් ජපාන සාම නියෝජිත යසුසි අකාමිට ද මේ බව දැනුම් දී තිබේ. උතුර නැගෙනහිර පළාත්වල සුනාමි වාසනයට ගොදුරු ව ඇත්තේ ග්‍රාම සේවා වසම් 47 ක් පමණකි. එවැනි ග්‍රාම සේවා වසම් සුළු ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීමට ඒකාබද්ධ යාන්ත්‍රණයක් අවශ්‍ය වන්නේ නැත. එසේ ම රනිල් වික්‍රමසිංහ පාලන සමයේ ප්‍රකාශිත යෝජනියෝ ප්‍රකාශයට හෝ එල්ටීටීඊ සංවිධානය එකඟ කරවා ගැනීමට ආණ්ඩුව සේ ම ජාත්‍යන්තර ප්‍රජාව ද මෙතෙක් අසමත් වී සිටී. ළමා සෙබළුන් බඳවා ගැනීම නැවැත්වීම, සාතන නැවැත්වීම, පැහැර ගැනීම් හා කප්පම් ගැනීම් නැවැත්වීම යන කරුණු යෝජනියෝ ප්‍රකාශනයට ඇතුළත් ය. මෙවැනි කරුණු හෝ මූලික නැති එල්ටීටීඊ සංවිධානයට ඒකාබද්ධ යාන්ත්‍රණයක් ලබා දී නිල තත්වයක් ලබා දෙන්නට උත්සාහ කරන්නේ මන්දැයි ජවිපෙ නියෝජිතයන් එහි දී යසුසි අකාමිගෙන් ප්‍රශ්න කොට තිබේ. එසේ ම ඒකාබද්ධ යාන්ත්‍රණය හා සාමය අතර සබඳතාවක් ඇතැයි ජනාධිපතිනිය පවසා ඇත්තේ අකාමි වැනි සාම නියෝජිතයන් පවසා ඇත්තේ එසේ නොවන බව ය. එසේ නම්, මේ ඒකාබද්ධ යාන්ත්‍රණයට ජාත්‍යන්තර ප්‍රජාව තෙරපී උනන්දු වන්නේ ඇයි දැයි යනුවෙන් ද ජවිපෙ නියෝජිතයන් අකාමිගෙන් ප්‍රශ්න කොට තිබේ. එහෙත් එකී ප්‍රශ්නවලට නිශ්චිත පැහැදිලි පිළිතුරු ලැබී නැත.

ඒකාබද්ධ යාන්ත්‍රණයට රට තුළ පවතින විරෝධය තවත් උත්සන්න කෙරෙන සිදුවීම්ක් ද මැයි 31 දින සිදු විය. ඒ ශ්‍රී ලංකා යුද හමුදාවේ පළමුවැනි සන්ධාරිධ සුද්ධි බලකායේ අණ දෙන නිලධාරී මේජර් තුවාන් මුතාලිෆ් ඝාතනය එම සිදුවීමයි. මිලේනියම් සිටි පාවාදීමෙන් අත්පැරුණ එල්ටීටීඊ සංවිධානය ඝාතනය කළ රජයේ බුද්ධි අංශ සාමාජිකයන් අතරින් ඉහළ ම නිලධාරියා මේජර් මුතාලිෆ් ය. මාධ්‍ය මගින් අනාවරණය වී නොතිබුණ ද මේජර් මුතාලිෆ් ටෙව් ඒකියනාවය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළ තිරිඟින හා දක්ෂ නිලධාරියෙකි. අද කොටි සංවිධානයේ බරපතල ම ප්‍රශ්නය වන කරුණා එම සංවිධානයේ ඉළුත් විමට අවශ්‍ය කටයුතු සැලසුම් කෙරුණේ මේජර් මුතාලිෆ්ගේ මෙහෙයවීම මත බව කොටින්ගේ නිල ප්‍රකාශනයක් බදු 'සුබර්මලි' පුවත්පත වාර්තා කොට තිබිණි.

එල්ටීටීඊ සංවිධානය මෙතෙක් කළ ඝාතනවලට ඔවුන් සම්බන්ධ බව යුද හමුදාව සෘජුව ප්‍රකාශ කළේ නැත. ඒ සටන් විරාම ගිවිසුම නිසාවෙනි. එහෙත් මේජර් මුතාලිෆ් ඝාතනය එල්ටීටීඊ පිස්තෝල කල්ලියේ ක්‍රියාවක් බව යුද හමුදාව ප්‍රකාශ කොට ඇත. එයින් පෙනී යන්නේ මේජර් මුතාලිෆ් යුද හමුදාවට හා රටට කොතෙක් වැදගත් අංශෙකු වූවේ ද යන්න හා ඔහුගේ ඝාතනය සමග යුද හමුදාව තුළ ඇති වී තිබෙන මානසිකත්වයයි.

මේජර් මුතාලිෆ් ඝාතනයත් සමග එල්ටීටීඊ සංවිධානයට ඒකාබද්ධ යාන්ත්‍රණයක් ලබා නොදීය යුතු බවට ජවිපෙ ගොඩ නඟන දන්නා බවත්, කොටි දේශපාලන අංශයේ නායක කමිටු ලෙස්වන් ද ප්‍රකාශ කර තිබේ. මේ අතර එල්ටීටීඊ සංවිධානයට ගීලෑ වී ඒකාබද්ධ යාන්ත්‍රණයට එකඟ වී සිටින බව ජනාධිපතිනිය යන යන තැන කියා සිටිය ද තමන්ට යුද්ධය හැර වෙනත් විකල්පයක් නැතැයි එල්ටීටීඊ සංවිධානය පවසා තිබේ. ඒ බව ජාත්‍යන්තර ප්‍රජාවට ද දනුම් දීමට ඔවුන් සූදානම් බව බව දැන ගන්නට තිබේ. ජාත්‍යන්තර ප්‍රජාව යැයි කියන පිරිස ඒකාබද්ධ යාන්ත්‍රණයක් සඳහා කොන්දේසි විගහිකව තෙපි සිටිය ද කලාපීය බලවතා සහ අදහස් අසුළුවැසියා වන ඉන්දියාව ඊට එකඟ නැත. එනිසා, මේ ලිපිය ලියන අවස්ථාව වන විට ඉන්දියාව ඊට එකඟ කරවා ගැනීමේ අරමුණින් ජනාධිපතිනිය ඉන්දියාවට ගොස් සිටී. එහෙත් ජනාධිපතිනියගේ එම වැයම පල දරුණු ඇතැයි අපේක්ෂා කළ නොහැක. මිනත් යන්, ඉන්දියාව මේ දක්ෂා ඒ සම්බන්ධයෙන් කිසිදු යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැති බැවිනි.

මේ ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවීම සඳහා බාහිරව පවත්නා අවාසි සහගත තත්වයන් ය. ඊට අමතරව ඒකාබද්ධ යාන්ත්‍රණය සම්බන්ධයෙන් එම පක්ෂය එනම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ ම ඇති වන ප්‍රතිවිරෝධතාවයන්ට මුහුණ දීමට ද ජනාධිපතිනියට සිදුවනු ඇත. පොදු යාන්ත්‍රණය නිසා තම පක්ෂය තුළ උලු අර්බුද ඇතිවිය හැකි යැයි එම පක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් පක්ෂ මහ ලේකම් මෛත්‍රිපාල සිරිසේන මහතාට ලිඛිතව දනුම් දී තිබේ. ඔවුන්ගේ එක් තර්කයක් වන්නේ මෙම යාන්ත්‍රණය පිළිබඳ මන්ත්‍රීවරුන් වශයෙන් කමන් කිසිවක් ම නොදන්නා බැවින්, ජනතාව ඉදිරියේ අසීරුතාවට පත්වන බව ය. එසේ ම යාන්ත්‍රණය ඇති කරන්නේ නම් ආණ්ඩුවෙන් ඉවත් වන බව ජවිපෙ අනතුරු ඇඟවා තිබීම නිසා ආණ්ඩුව බිඳ වැටීමේ අවදානම ය. මේ නිසා වමාම යෝජිත ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් දැනුවත් කළ යුතු බව ඔවුන් පක්ෂ මහ ලේකම්වරයාට දනුම් දී තිබේ.

මේ යාන්ත්‍රණයත් සමග අර්බුදයකට මුහුණ පා සිටින අනෙක් පුද්ගලයා වන්නේ අමාත්‍රි මගින්ද රාජපක්ෂ ය. තම තනතුර හෝ පූජා කොට යාන්ත්‍රණය පිහිටුවන බවට ජනාධිපතිනිය සිංහ නාද නගන්නේ ව්‍යවස්ථානුකූලව ලබන වසරෙන් ඇගේ ක්‍රියාකාරී දේශපාලනය අවසන් වන බැවිනි. එහෙත් අමාත්‍රිවරයාගේ දේශපාලන දිවියේ ස්වර්ණමය යුගය එළඹෙන්නේ ලබන වසරෙනි.

මීළඟ ජනාධිපතිවරණය පැවැත්විය යුත්තේ ලබන වසරේ දී ය. එහෙත් අත්සන් ජනතා නිදහස් සන්ධානය තවමත් ඒ සඳහා අපේක්ෂකයකු නම් කොට නැත. එසේ වුවත්, අගෙළිහි මගින්ද රාජපක්ෂ මේ දක්වා කටයුතු කොට ඇත්තේ ජනාධිපති අපේක්ෂකයා වීමේ අපේක්ෂාව ඇතිව ය. දනට රට තුළ ඇත්තේ ද මීළඟ ජනාධිපති අපේක්ෂකයා ඔහු විය යුතුය යන මතයයි. සන්ධානයේ අපේක්ෂකයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මහතා සමග තරග කළහොත් ජනාධිපතිවරණයෙන් ඔහු ජය ගන්නා බව ද නියත ය. අත්සන් ජාතික පක්ෂය ද මේ බව දනී.

ව්‍යවස්ථාවේ ඉතිහාසය නැතත්, ජනාධිපතිනිය යළිත් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නේ නම්, ඒ සඳහා තම සහය දෙන බව අත්සන් ජාතික පක්ෂය ප්‍රකාශ කොට ඇත්තේ ද එනිසා ය.

එහෙත් අත්සන් ජනතා සන්ධානය බිඳී ගිය හොත්, මගින්ද රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණයෙන් ජය ගැනීමට නොහැකි ය. යාන්ත්‍රණය අත්සන් කළ හොත් සන්ධානය බිඳ වැටෙන බව ජවිපෙ දනටමත් ප්‍රකාශ කොට තිබේ. එසේ වුවහොත් ජනාධිපතිවරණයට තම පක්ෂයෙන් ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීමට ජවිපෙ තීරණය කරනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ මගින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපති සිහිනය බිඳ වැටීම ය.

ඇත්ත වශයෙන් ම මගින්ද ජනාධිපති කරවීමට ජනාධිපතිනියට ද අවශ්‍යතාවක් නැත. ඔහුට අගමැතිකම දුන්නේ ද තොමැ බැරිකමට ය. යළි ක්‍රියාකාරී දේශපාලනයේ නිරත වීමට නොහැකි නිසා අත්සන් ජාතිත්ගේ සංවිධානයේ මහ ලේකම් වැනි තනතුරක් පිළිබඳ ජනාධිපතිනියගේ දොල දුකක් පහල වී ඇති බවට ද සමුඝසූචක් තිබේ. ඒකාබද්ධ යාන්ත්‍රණය ලබා දීම එවැනි තනතුරක් සඳහා විශේෂ අමතර සුදුසුකමකි. එසේ ම මගින්ද ජනාධිපති වීම ද එමගින් ලබන්වා ගත හැක.

එහෙත් ඉතා අසීරුවෙන් අගමැතිකම ලබාගත් මගින්ද ජනාධිපතිකම ලබා ගැනීම සඳහා ද ඕනෑ ම ඔධනක් දෙනු ඇත. දනට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතරය සිටින්නේ මගින්ද සමග ය. ඉන්පසු වහන්සේලාගේ බහුතරය සිටින්නේ මගින්ද සමග ය. ජනතා විමුක්ති පෙරමුණ සමග ද ඔහුගේ ඇයි හොඳයිය පෙරට වඩා ශක්තිමත් ය.

එනිසා, තමන්ගේ බෙල්ල කැපී යන ඒකාබද්ධ යාන්ත්‍රණයකට මගින්ද ද ඉඩ නොතබනු ඇත. ඔහු ඒ සඳහා විවෘතව පෙනී නොසිටිය ද බොහෝ පිටුපස සිට ක්‍රියාත්මක වනු ඇත. මගින්ද සේ ම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන් කිහිප දෙනෙකු හැර බහුතරය ද යාන්ත්‍රණය දී ආණ්ඩුව කඩා ගන්නට සූදානම් නැත. ඒ විපක්ෂයට ගිය විට විඳින්නට සිදුවන දුක් ඔවුන් ද දන්නා බැවිනි. එනිසා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැත්තෙන් ආණ්ඩුව බිඳ වැටීමට ගැනීමට කවරෙකුත් සූදානම් නැත.

එසේ ම, රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් සිහසුනේ පරිමණ වෙමින් සිටින ජවිපෙ ද ආණ්ඩුවෙන් යැමට සූදානම් නැත. ඔවුන් ආණ්ඩුවෙන් ඉවත් වුවහොත්, එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීම වලක්වන්නට නොහැකි ය. එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුවහොත් රට බෙදීම ද, වලක්වන්නට බැරි ය. එසේ ම, එක්සත් ජාතික පක්ෂ පාලනයක් යටතේ දැඩි මර්ධනයකට මුහුණ දීමට ජවිපෙට සිදුවනු ඇත. මේ තත්වයන් මත ජවිපෙට ද අවශ්‍ය වන්නේ කෙසේ හෝ සන්ධාන ආණ්ඩුව රැකගෙන ඉදිරියට ගෙන යෑම ය. එය සිදුවිය හැක්කේ එක් කොන්දේසියක් යටතේ පමණකි. ඒ ඒකාබද්ධ යාන්ත්‍රණය ඇති නොකිරීම ය. ඒකාබද්ධ යාන්ත්‍රණය අද අත්සන් කරනවා හෙට අත්සන් කරනවා යැයි කවුරුත් කිව ද එය සිදු නොවන්නක් වන්නේ මේ නිසා ය. ■

ඒකාබද්ධ යාන්ත්‍රණය යනු තවත් බාලගිරි දෝෂයක් ද?

තම තනතුර හෝ පූජා කොට යාන්ත්‍රණය පිහිටුවන බවට ජනාධිපතිනිය සිංහ නාද නගන්නේ ව්‍යවස්ථානුකූලව ලබන වසරෙන් ඇගේ ක්‍රියාකාරී දේශපාලනය අවසන් වන බැවිනි.

තර්කය තවත් ශක්තිමත් වී තිබේ. පැහැදිලිව ම කොටි ඉලක්කයක් වී සිටි මේජර් මුතාලිෆ් සාමාන්‍යයෙන් 50 දෙනෙකුගෙන් පමණ සමන්විත ආරක්ෂකයන් පිරිසක් යොදවා සිටිය ද ඔහු ඝාතනය වූ දිනයේ ඒ කිසිවෙකු සිට නැත. මෙයින් පෙනී යන්නේ ආණ්ඩුව හා කොටි සංවිධානය අතර රහස් එකඟතාවක් ඇති බව යැයි සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය ද ප්‍රකාශ කර තිබේ. ඒ කාරණා සියල්ල පසෙක තැබූව ද එල්ටීටීඊ සංවිධානය ඒකාබද්ධ යාන්ත්‍රණයට එකඟ වීම යනු ඔවුන් ආණ්ඩුවේ ස්වාධිපත්‍ය පිළිගැනීම බවට ජනාධිපතිනිය ප්‍රමුඛ ඒකාබද්ධ යාන්ත්‍රණය හවුල ගොඩ නගන තර්කය මෙම ඝාතනයත් සමග බරපතල ලෙස බිඳී වැටී තිබේ. ඒකාබද්ධ යාන්ත්‍රණය රජයේ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන්නක් බව ජනාධිපතිනිය ප්‍රමුඛ හවුල ප්‍රකාශ කළ ද එම යාන්ත්‍රණය ජනාධිපතිතුමා, අමාත්‍ය මණ්ඩලයට හෝ පාර්ලිමේන්තුවට වග නොකියන ඒකකයක් බවත්, ආණ්ඩුව ද එය කරන්නේ කොහොම ද කියා ය.

එහෙත් ඒකාබද්ධ යාන්ත්‍රණය කරන්නේ කොහොම ද කියා ය. ඒ ගැන ජනතාවට දැනගන්නට ලැබී නැත. ඒ ගැන ජනතාවට දැනගන්නට ලැබී ගිය හොත්, මගින්ද රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණයෙන් ජය ගැනීමට නොහැකි ය. යාන්ත්‍රණය අත්සන් කළ හොත් සන්ධානය බිඳ වැටෙන බව ජවිපෙ දනටමත් ප්‍රකාශ කොට තිබේ. එසේ වුවහොත් ජනාධිපතිවරණයට තම පක්ෂයෙන් ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීමට ජවිපෙ තීරණය කරනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ මගින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපති සිහිනය බිඳ වැටීම ය.

ඇත්ත වශයෙන් ම මගින්ද ජනාධිපති කරවීමට ජනාධිපතිනියට ද අවශ්‍යතාවක් නැත. ඔහුට අගමැතිකම දුන්නේ ද තොමැ බැරිකමට ය. යළි ක්‍රියාකාරී දේශපාලනයේ නිරත වීමට නොහැකි නිසා අත්සන් ජාතිත්ගේ සංවිධානයේ මහ ලේකම් වැනි තනතුරක් පිළිබඳ ජනාධිපතිනියගේ දොල දුකක් පහල වී ඇති බවට ද සමුඝසූචක් තිබේ. ඒකාබද්ධ යාන්ත්‍රණය ලබා දීම එවැනි තනතුරක් සඳහා විශේෂ අමතර සුදුසුකමකි. එසේ ම මගින්ද ජනාධිපති වීම ද එමගින් ලබන්වා ගත හැක.

එහෙත් ඉතා අසීරුවෙන් අගමැතිකම ලබාගත් මගින්ද ජනාධිපතිකම ලබා ගැනීම සඳහා ද ඕනෑ ම ඔධනක් දෙනු ඇත. දනට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතරය සිටින්නේ මගින්ද සමග ය. ඉන්පසු වහන්සේලාගේ බහුතරය සිටින්නේ මගින්ද සමග ය. ජනතා විමුක්ති පෙරමුණ සමග ද ඔහුගේ ඇයි හොඳයිය පෙරට වඩා ශක්තිමත් ය.

එනිසා, තමන්ගේ බෙල්ල කැපී යන ඒකාබද්ධ යාන්ත්‍රණයකට මගින්ද ද ඉඩ නොතබනු ඇත. ඔහු ඒ සඳහා විවෘතව පෙනී නොසිටිය ද බොහෝ පිටුපස සිට ක්‍රියාත්මක වනු ඇත. මගින්ද සේ ම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන් කිහිප දෙනෙකු හැර බහුතරය ද යාන්ත්‍රණය දී ආණ්ඩුව කඩා ගන්නට සූදානම් නැත. ඒ විපක්ෂයට ගිය විට විඳින්නට සිදුවන දුක් ඔවුන් ද දන්නා බැවිනි. එනිසා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැත්තෙන් ආණ්ඩුව බිඳ වැටීමට ගැනීමට කවරෙකුත් සූදානම් නැත.

එසේ ම, රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් සිහසුනේ පරිමණ වෙමින් සිටින ජවිපෙ ද ආණ්ඩුවෙන් යැමට සූදානම් නැත. ඔවුන් ආණ්ඩුවෙන් ඉවත් වුවහොත්, එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීම වලක්වන්නට නොහැකි ය. එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුවහොත් රට බෙදීම ද, වලක්වන්නට බැරි ය. එසේ ම, එක්සත් ජාතික පක්ෂ පාලනයක් යටතේ දැඩි මර්ධනයකට මුහුණ දීමට ජවිපෙට සිදුවනු ඇත. මේ තත්වයන් මත ජවිපෙට ද අවශ්‍ය වන්නේ කෙසේ හෝ සන්ධාන ආණ්ඩුව රැකගෙන ඉදිරියට ගෙන යෑම ය. එය සිදුවිය හැක්කේ එක් කොන්දේසියක් යටතේ පමණකි. ඒ ඒකාබද්ධ යාන්ත්‍රණය ඇති නොකිරීම ය. ඒකාබද්ධ යාන්ත්‍රණය අද අත්සන් කරනවා හෙට අත්සන් කරනවා යැයි කවුරුත් කිව ද එය සිදු නොවන්නක් වන්නේ මේ නිසා ය. ■